# ලංකා විදුලිබල මණ්ඩලය

## පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ශාඛාව

# ඇබෑර්තු

## සිවිල් අධිකාරී සහ කනිෂ්ඨ කාර්මික සහයක තනතුරු

### කොන්ත්‍රාත් පදනම මත අවුරුදු 02 ක කාලයක් සඳහා

විදුලිබල හෝ කාර්මික ව්‍යාපෘති ක්ෂේත්‍රයට අදාළ පහත සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් ඉහත සඳහන් ශාඛාවේ පවතින පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. සිවිල් අධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම / පුරප්පාඩු 02)

**රාජකාරී**

- මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතියේ අදියර III හි ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා අදාළ තාක්ෂණික සේවාවන් ලබාදීම.

**සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් අවශ්‍යතා :**

- සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරාලිය යුතුය.

  ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT)හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES)හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඉංජිනේරුවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE) හෝ තාක්ෂණවේදය පිළිබඳ ජාතික සහතිකපත්‍ර පාඨමාලාව (NCT) සහ අදාළ අංශයේ තනතුරක වසර 5 ක පළපුරුද්ද.
- බඳවාගන්නා දිනට වයස අවුරුදු18 – 30ත් අතර විය යුතුය.
- මහාමාර්ග ඉදිකිරීම, සුළං විදුලි බලාගාර ඉදිකිරීම්, ග්‍රිඩ් උපපොළ හෝ අධිවෝල්ටීයතා සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම් සම්බන්ධයෙන් වන දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.
- සිංහල හෝ දමිළ සහ ඉංග්‍රීසි භාෂා හැසිරවීමෙහි මනා දැනුමක් තිබිය යුතුය. දෙමළ භාෂාවෙන් වැඩකිරීමට සහ සන්නිවේදනය කිරීමට ඇති හැකියාව අමතර සුදුසුකමක් වනු ඇත.
- මන්නාරම්, අනුරාධපුර, පුත්තලම් දිස්ත්‍රික්කවල හෝ උතුරු පළාතේ පදිංචි අයදුම්කරුවන් විශේෂයෙන් සලකා බැලෙනු ඇත.

### 02. කනිෂ්ඨ කාර්මික සහයක (කොන්ත්‍රාත් පදනම / පුරප්පාඩු 03)

**අයදුම්කරුවන් පහත දැක්වෙන මූලික සුදුසුකම් සපුරා තිබිය යුතුය.**

- අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් එක් වරකදී ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව විෂයයන් 6කින් සමත්වීම හෝ පහත සඳහන් සිවිල්, විදුලි හෝ යාන්ත්‍රික ක්ෂේත්‍රයන්හි 3 වන මට්ටම හෝ ඉහළ ජාතික නිපුණතා සහතිකය (NVQ-3) ලබා තිබීම.
  - විදුලි කාර්මික ශිල්පී (ගෘහස්ත/කර්මාන්ත), විදුලි මෝටර් එතුම් ශිල්පී, වායුරෝධක ශිල්පී (Pneumatic Technician), විද්‍යුත් උපකරණ තාක්ෂණ ශිල්පී යන ආදිය.
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ පිළිගත් ආයතනයකින් ඉහත ජාතික නිපුණතා සහතික (NVQ) ලබා තිබිය යුතුයි.
- බඳවා ගන්නා දිනට වයස අවුරුදු 18 –25 ත් අතර විය යුතුය.
- සිංහල හෝ දමිළ සහ ඉංග්‍රීසි භාෂා හැසිරවීමෙහි මනා දැනුමක් තිබිය යුතුය. දෙමළ භාෂාවෙන් වැඩකිරීමට සහ සන්නිවේදනය කිරීමට ඇති හැකියාව අමතර සුදුසුකමක් වනු ඇත.
- මන්නාරම්, අනුරාධපුර, පුත්තලම් දිස්ත්‍රික්කවල හෝ උතුරු පළාතේ පදිංචි අයදුම්කරුවන් / 4 වන මට්ටමේ ජාතික නිපුණතා සහතිකය (NVQ-4) ලබා ඇති අයදුම්කරුවන් විශේෂයෙන් සලකා බැලෙනු ඇත.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2025.03.28** දින.

**තෝරාගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**සේවයට අදාළ කොන්දේසි :**

- සේවය සඳහා බඳවාගැනීම අවුරුදු දෙකක (02) කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වනු ඇත.
- සේවා ස්ථානය උතුරු පළාත වේ.
- තෝරාගත් අයදුම්කරුවන් මන්නාරම පිහිටි ව්‍යාපෘති වැඩබිමේ සේවය කළයුතු අතර, අමතර පැය වැඩකිරීමට හැකිවිය යුතුය.

**වැටුප් හා වේතන:**

- සිවිල් අධිකාරී තනතුර – ලංකා විදුලිබල මණ්ඩලයේ සිවිල් අධිකාරී තනතුර සඳහා වන EL2 මූලික වැටුප් පියවර
- කනිෂ්ඨ කාර්මික සහයක – ලංකා විදුලිබල මණ්ඩලයේ කනිෂ්ඨ කාර්මික සහයකයින් සඳහා වන EN5 මූලික වැටුප් පියවර

**වෙනත් ප්‍රතිලාභ :**

- තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් සේවක අර්ථ සාධක අරමුදලට (EPF)තම වැටුපෙන් 10% දායකත්වය ලබාදිය යුතු අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 15% ප්‍රමාණයකින් ඊට දායකත්වය ලබා දේ.
- සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) 3% දායකත්වය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා දේ

ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් විසින් තම සම්පූර්ණ නම, පුද්ගලික සහ රාජකාරී ලිපිනය, තොරතුරු විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ විස්තර හා දුරකථන අංක සහිත සම්පූර්ණ අයදුම්පත්‍රයක් (ඉංග්‍රීසි භාෂාවෙන් පුරවන ලද) ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ **"සිවිල් අධිකාරී / කනිෂ්ඨ කාර්මික සහයක තනතුර- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ශාඛාව"** යනුවෙන් සටහන් කළ යුතුය.

රාජ්‍ය දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය ආයතන වල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු අතර, යම් හෙයකින් තෝරා ගතහොත් නිදහස් කළ හැකිද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

**වැඩිදුර තොරතුරු සඳහා :**
**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පු.බ.සං. ශාඛාව)**
**දු.අංක : 0112-889640**
**ෆැක්ස් : 0112-869631**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පු.බ.සං.)**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**අංක 949/A/1,T.C. උද්‍යාන පාර,**
**පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**"විදුලිබලයෙන් සසිරිමත් දිවියක්"**